# කෑගල්ල දිස්ත්‍රික්කයේ සංස්කෘතික සංචාරක කර්මාන්තය පිළිබඳ අධ්‍යයනයක්

# Study of Cultural Tourism Industry in Kegalle District

**මල්වානේ සෝභිත හිමි**
**ගල්වැවේ විමලඛන්ති හිමි**

## Abstract

Cultural heritage can be identified as being constantly linked to the tourism industry. Since the distant past, the tourism process has gradually become a business or an employment industry through various setbacks and advancements until today. Globally, Sri Lanka is an outstanding country in the cultural tourism industry. Accordingly, the cultural heritage of this country occupies an important place in the tourism industry. There are many cultural heritage that are unique to Kegalle district among the cultural heritages scattered all over the island. An article on the tourism industry is written here based on selected culturaly important place. The archaeological, historical and current nature of those cultural heritage as well as the existing problems, challenges and strengths are explained and mainly the process of turning the cultural heritages of Kegalle cultural tourism into attractive heritage is discussed under formal heritage management.

**Keywords:** Cultural Heritage, Tourism Industry, Kegalla District

## හැඳින්වීම

"සංචරණය" යන්න මෑතක දී ලෝකයට හඳුන්වා දෙන ලද සංකල්පයක් නොව එය වසර දහස් ගණනක අතීතයකට හිමිකම් කියන්නකි. ජීවන පැවැත්ම, පාරිසරික විපර්යාස, අන්තර් මානව

කණ්ඩායම් අතර ඇති වන යුද අරගල සහ නව්‍ය සොයා යාම් වැනි හේතු කරණකොටගෙන මානව පරිණාමයේ මුල් අවධි වෙත අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වන්නේ, මානවයා ලෝකයේ වෙනස් පාරිසරික කලාප ඔස්සේ රටවල් කරා සංචරණය වීමට පටන් ගත් බවකි.

මෙසේ සංචාරක කර්මාන්තය (Tourism industry) යුරෝපීය රටවලට පමණක් සීමා නොවී ආසියාතික රටවල ද ව්‍යාපාරයක් බවට පත්ව ව්‍යාප්ත විය. එහි දී ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි රටවල සංචාරක කර්මාන්තය ප්‍රධාන වේ. ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ පිහිටීම, භූ දර්ශනය, දේශගුණික තත්ත්වය, ස්වභාවික සම්පත්, සංස්කෘතික සාධක, නටඹුන් නගර, වාරි කර්මාන්තය, කලාව, මානව විද්‍යාත්මක ලක්ෂණ, ආගන්තුක සත්කාර යනාදිය මෙරට සංචාරක කර්මාන්තයේ ව්‍යාප්තියට බලපාන්නට ඇත. විදෙස් රටවල සංචාරක ආකර්ෂණය දිනාගත් ස්ථාන හා ලංකාවේ එවැනි ස්ථාන හා සැසඳීමේ දී මෙරට සංචාරක ප්‍රවර්ධනයට ගෙන ඇති ක්‍රියාමාර්ග අවම මට්ටමක පවතින බව කිව යුතුය. කෙසේ නමුත් යුරෝපීය සංචාරක ව්‍යාපාරයට වඩා ආසියාතික සංචාරක ව්‍යාපාරය සතු විශේෂත්වය වන්නේ ඓතිහාසික සහ ජාතික සංස්කෘතික උරුමයන් පැවතීමයි. මේ නිසා සංචාරකයා ඉන්දියාව, චීනය, ශ්‍රී ලංකාව වැනි රටවල ගමන් කිරීමට අභිරුචියක් දැක්වූයේ එම රටවල දීර්ඝ ඉතිහාසයකට උරුම වූ සංස්කෘතික ලක්ෂණවලින් හා විස්මිත ස්මාරකවලින් මෙන්ම ස්වභාව සෞන්දර්ය හේතු කොට ගෙනය. මේ අනුව ලංකාවේ ඇති සංස්කෘතික උරුම අනෙක් ආසියාතික රටවලට වඩා සුවිශේෂත්වයෙන් යුක්ත බව තවදුරටත් සඳහන් කළ යුතු ය.

ශ්‍රී ලංකාවේ විවිධාත්මක උරුමයන් ඉලක්ක කර ගනිමින් දෙස් විදෙස් සංචාරකයා මෙරට සංචාරය කරන අතර ඒ සඳහා මෙරට සංස්කෘතිය ප්‍රධාන සාධකයක් වී ඇත. මේ නිසා විදෙස් සංචාරකයා ශ්‍රී ලංකාවේ සංස්කෘතික නගර, සැණකෙලි, සාම්ප්‍රදායික සංස්කෘතික උත්සව, ආගමික සංචරණ හා වන්දනා, පුරාවිද්‍යා ස්ථාන, ස්වභාවික යනාදී උරුමයන් වෙත සංචාරය කිරීමට අභිරුචියක් දක්වයි. මෙසේ වූ ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා වූ අතීතයකට උරුමකම් කියන ශ්‍රී ලංකාවේ සපරගමුව හෙවත් සබරගමුව පළාත, මධ්‍යම කඳුකරයේ

තෙත් කලාපීය ප්‍රදේශයක් ද පාරිසරික හා භූ පිහිටීම අතින් ඉතා සුන්දර පළාතක් ද වේ. කෑගල්ල සහ රත්නපුර එහි පරිපාලන දිස්ත්‍රික්ක වෙයි. ඉන් කෑගල්ල ප්‍රදේශය ඉහත කී සංචාරක ආකර්ෂණයන්ට කදිම තෝතැන්නකි. තවද කෑගල්ල කලාපය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට යටත් විජිත යුගය හා වර්තමානය දක්වා ම ඓතිහාසික සිදුවීම් රැසක් අනාවරණය කරයි. ඒ අනුව අප අවධානය යොමු කරනුයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සංස්කෘතික සංචාරක කර්මාන්තය පිළිබඳව බැවින් සංස්කෘතික සංචාරක කර්මාන්තය සහ ඒ හා බැඳි සංචාරක ප්‍රවර්ධන වැඩපිළිවෙළ කෙසේ වේ ද? කෙසේ විය යුතු ද? යන්න මෙහිලා සාකච්ඡා කෙරේ.

**සාකච්ඡාව**

ශ්‍රී ලංකාවේ දර්ශනීය භූ පිහිටීමකින් හෙබියා වූ සබරගමු පළාත, නිරිතදිග කොටසේ අභ්‍යන්තරයේ පිහිටා ඇති මධ්‍යම කඳුකරයේ බස්නාහිර සහ දක්ෂිණ වේදිකාව ලෙස හැඳින්විය හැකි ය (ස.වං.ක; 2003:174). ශ්‍රී ලංකාවේ අඩතැනි කලාපයක් වශයෙන් සුන්දර භූ විෂමතාවයකින් මෙන්ම නිරිතදිග තෙත් කලාපයට අයත් වර්ෂාපතනයෙන් සහ සූර්ය තාපයෙන් යුක්ත කෑගල්ල ප්‍රදේශය සුවදායක පරිසරයකි. කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ප්‍රකාශයට පත් කර ඇති "කෑගලු විත්ති" සහ "කෑගලු පුරාවත" යන ග්‍රන්ථවල සඳහන් අන්දමට කෑගල්ල දිස්ත්‍රික්කය වර්තමානයේ මාවනැල්ල, ගලිගමුව, රුවන්වැල්ල, දෙහිඕවිට, දැරණියගල, අරණායක, යටියන්තොට, කෑගල්ල, බුලත්කොහුපිටිය, රඹුක්කන හා වරකාපොල මැතිවරණ කොට්ඨාස වශයෙන් කොට්ඨාස 11කින් සමන්විත වෙයි. රාජාණ්ඩු සමයේ කෑගල්ල ප්‍රදේශය සතර කෝරළය, තුන් කෝරළය සහ පාත බුලත්ගම යන කොට්ඨාස ක්‍රමයට පැවති බව සඳහන් වෙයි. එමෙන්ම වර්ග කි.මී 1693 ක් පුරා පැතිර ඇති මෙම භූමිය දේශපාලනික, ආර්ථික, ආගමික, සංස්කෘතික සහ සමාජීය වශයෙන් සුවිශේෂී වැදගත්කමක් උසුලයි. දේශපාලනික වශයෙන් ක්‍රි. පූ. 6 සියවසටත් පෙර පටන් අද්‍යතන යුගය දක්වා දේශපාලන ගමන් මගක් ගොඩනැගී ඇති බවත්, ක්‍රි. පූ. 3 වන සියවසේ මහින්දාගමනයත් සමඟ ලැබුණු බුදුදහමේ ව්‍යාප්තිය ආගමික වශයෙනුත්, (ක්‍රි.පූ; 2022: 14) තේ, පොල්, රබර්, ගම්මිරිස්, කරාබු වැනි වැවිලි කෘෂිකාර්මික

ආර්ථික රටාවකුත් අස්පර්ශිත මෙන්ම ස්පර්ශිත සංස්කෘතික උරුමයක් වශයෙනුත්, වර්තමානයේ සියලු ජාතීන්, ජන කණ්ඩායම් ජීවත් වන සමාජීය වැදගත්කමකින් යුක්ත පෙදෙසක් ලෙසත්, කැගල්ල දිස්ත්‍රික්කය හඳුන්වන්න හැකිය. ශ්‍රී ලංකාවේ අතීතය හැදෑරීමේ දී ප්‍රාග් ඓතිහාසික, පූර්ව ඓතිහාසික පවත්නා යුග විමර්ශනයට ලක් කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ දැනට සිදු කර ඇති පූර්ව පර්යේෂණ විශාල ප්‍රමාණයක සාධක කැගල්ලෙන් සුළබව හමුවේ. මානව විද්‍යාඥයෙකු වන පී.ඊ.පී. දැරණියගල මෙන්ම එස්.යූ. දැරණියගල, නිමල් පෙරේරා වැනි පුරාවිද්‍යාඥයන් විසින් සිදු කරන ලද කැණීම්, ගවේෂණ ගණනාවක් තුළින් කැගල්ල ප්‍රදේශයේ ප්‍රාග් ඓතිහාසික ස්ථාන රැසක් අනාවරණය කරගෙන තිබේ (දයානන්දඃ 2006ඃ 32-33). අදින් වසර 34,000 - 9,000 ත් අතර කාලයට කිතුල්ගල බෙලිලෙන කැගල්ල ප්‍රදේශයේ පැරණිත ම සාධක හමුවන ස්ථානය ලෙසත්, වසර 10,350 කට අයත් අත්තනගොඩ අලුලෙනත්, වරකාපොල දොරවකකන්ද ලෙනත් කැගල්ල ප්‍රදේශයේ දැනට සිදු කර ඇති ප්‍රාග් ඓතිහාසික පර්යේෂණයන් ය. ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසු මානවයා සංචාරක දිවි පෙවෙතෙන් ක්‍රමානුකූලව ගෘහාශ්‍රිත ජීවන රටාවකට හුරු වී ඇත. ඔවුන් නිවාස තනා ගනිමින් යකඩ භාවිතයත් සමඟ කෘෂි කර්මාන්තය හා සත්ත්ව පාලනයට පිවිස ඇත (සෝමදේවඃ 2016ඃ 435-446). යකඩ යුගය, මහ ශිලා අවධිය, මෙගලිතික අවධිය ලෙස හඳුන්වනු ලබන්නේ පූර්ව ඓතිහාසික අවධියටම ය (ස.වං.ක; 2003ඃ 148). කැගල්ල දිස්ත්‍රික්කයේ පූර්ව ඓතිහාසික අවධියට අයත් සාධක විරල නමුත් "ගල්අතර" නම් ස්ථානය, "පදියගම්පොල" නම් පූර්ව ඓතිහාසික අවධියට අයත් ස්ථාන ද්විත්වය අදින් වසර 2,400 ක පමණ සිට 1,700 ක පමණ කාල පරාසයකට අයත් බව සඳහන් වෙයි (කෑ.පු; 2022ඃ 13). කෙසේ නමුත් ශ්‍රී ලංකාවේ අනිකුත් ප්‍රදේශ හා සැසඳීමේ දී තෙත් කලාපීය කැගල්ල ප්‍රදේශය පූර්ව ඓතිහාසික යුගයේ කැපී පෙනෙන විරල බවක් දක්නට ලැබේ. ආදී මානවයාගේ පටන් ජනී ජනයාගේ භූමියක් වූ කැගල්ල ප්‍රදේශය දැදිගම, සීතාවක වැනි ඓතිහාසික පුරවරවලින් යුක්ත වන්නා සේම පුරාවිද්‍යාත්මක, පාරිසරික උරුමවලින් ද සැදුම්ලත් ජන්ම භූමියකි. ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පූර්ව ඓතිහාසික යුගයට පා තබන කැගල්ල ක්‍රමයෙන්

ඓතිහාසික යුගයට පිවිසෙයි. විජයාගමනය සිදු වූ කාල පරිච්ඡේදය (ක්‍රි.පූ. 6 වන සියවස) ලංකාවේ ඓතිහාසික යුගයේ ආරම්භය ලෙස සැලකේ. පූර්ව ඓතිහාසික යුගයේ දී පැවති යකඩ භාවිතය හා මැටි වළං භාවිතය ක්‍රමවත්වෙමින් ඓතිහාසිත අවධියේ ආරම්භයත් සමඟ ලේඛනය තවදුරටත් සංවර්ධනය වන්නට විය. දාර්ශනික හා ආගමික සංදර්භයක මිනිස් සමාජය ශිෂ්ටාචාරවත් වීමේ මූලික අඩිතාලම වැටෙන්නේ මෙම කාලවකවානුවේ දී ය.

කෑගලු ඓතිහාසිකත්වයට, අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා වූ රාජාණ්ඩු පාලන ක්‍රමය ප්‍රබලව බලපා ඇත. ඒ අනුව කෑගල්ල ලංකාවේ රජකම් කළ රජවරුන්ගේ ප්‍රාදේශීය පාලන ඒකකයක් ද වී ඇත. ඓතිහාසික අවධියේ දේශපාලනමය වශයෙන් රුහුණු, පිහිටි, මායා නමින් පාලන ප්‍රදේශ කිහිපයක් පැවත ඇත. ක්‍රි.ව 6 වන සියවසයේ සිට කෑගල්ල ප්‍රදේශය අයත් වූයේ මායා (දක්ඛිණ දේශය) හෙවත් මලය දේශයට ය (රණවැල්ලඃ 2016ඃ 33.). මෙවැනි අතීත කතාන්දර ගොන්නකින් අනූන මෙම ප්‍රදේශයේ නෂ්ටාවශේෂ ඉපැරණි ශිෂ්ටාචාරයක් ගොඩනගයි. ඒ අනුව මෙම ප්‍රදේශයේ අතීතය, පුරාවිද්‍යාත්මක පර්යේෂණයන්ගෙන් අදවන විට යම් තරමකට අනාවරණය කරගෙන තිබේ. මේ නිසා කෑගල්ල ප්‍රදේශයේ ඉතිහාසය, ජනප්‍රවාද හා තුලනාත්මකව විමසීමේ හැකියාව පවතී. තව ද කෑගලු ප්‍රදේශයේ ඇදහිලි, විශ්වාස හා සම්බන්ධ යාගහෝම සිරිත් විරිත් ආදී අංග අතීත උරුමයන්ගෙන් ශේෂව පවතින සංස්කෘතික ලක්ෂණ පිළිබිඹු කෙරේ. එසේම මෙම ප්‍රදේශයේ ශාන්තිකර්ම පරම්පරා ද අල්ගම මදුරුපිටිය, තුත්තිරි වැවේ වෙද පරපුර, දෙවනගල වෙද පරපුර, හිග්ගොඩ වෙද පරපුර, හොලොම්බුව වෙද පරපුර වශයෙන් ශාන්තිකර්ම පරම්පරා කිහිපයක් ද පාරම්පරික වෛද්‍ය ක්‍රම හා චිත්‍ර, මූර්ති, කැටයම් ශිල්පීය පරම්පරා කෑගල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසිකමය වැදගත් සමාජීය තොරතුරු සපයයි.

**උරුමය විග්‍රහය හා හඳුනා ගැනීම**

ක්‍රි.ව. 15 වන සියවසයේ දී යුරෝපයේ ආරම්භ වූ පුනරුදයෙන් සංස්කෘතික, කලා හා විද්‍යා විෂයන්ගේ ප්‍රබෝධයත් සමග ඓතිහාසික වටිනාකම් ඇති කලා කෘති හා පැරණි කෞතුක

වස්තු කෙරෙහි ධනවතුන්ගේ අවධානය යොමු විය (මැන්දිස් සහ ශ්‍යාමලී, 2019: 01). අනතුරුව 1950 දී ඇති වූ කාර්මික විප්ලවයෙන් පසු පෞරාණික සංස්කෘතියට අයත් වස්තූන් විනාශයට පත් වීමට පටන් ගැනීම නිසා සංස්කෘතික සම්පත් ගලවා ගැනීමේ පුරාවිද්‍යාව (Rescue Archaeology) හඳුන්වාදීමත් සමඟ සංස්කෘතික සම්පත් කළමනාකරණය කිරීමට කටයුතු කරන ලදි. 1960 පමණ වන විට නව පුරාවිද්‍යාව (New archaeology) හඳුන්වා දීමෙන් සංස්කෘතික හා ස්වභාවික සම්පත් කළමනාකරණය කිරීමේ ප්‍රතිපත්ති සකස් වන්නට විය. එම ප්‍රතිපත්ති ක්‍රියාවලි යුනෙස්කෝ (UNESCO), අයිකෝමස් (ICOMOS) වැනි ආයතන මැදිහත් වීමෙන් උරුම සම්පත් සුරක්ෂා කිරීමේ අරමුණෙන් ලෝකයට ම පොදු ප්‍රතිපත්ති බවට පත්කොට තිබේ. ඕනෑම රටක, ජාතියක විවිධ ජන කණ්ඩායම්වලට අවේණික වූ අතීත මුතුන්මිත්තන් විසින් නිර්මාණය කළ සංස්කෘතික උරුම මෙන්ම මිනිසාගේ මැදිහත් වීමකින් තොරව නිර්මාණය වී ඇති ස්වභාවික උරුම ද දකින්නට ලැබේ. ස්වභාවික හා සංස්කෘතික වශයෙන් වූ මෙම උරුම ආරක්ෂා කර ගැනීම පාරම්පරිකව අතීතයේ සිට සිදුව ඇත. මේ නිසා වර්තමානයට දායාද වී ඇති එම උරුම අනාගතයට සුරැකිව පවත්වා ගැනීම උරුම කළමනාකරණය කරන්නන් සතු වගකීමකි. ජාති, ආගම්, කුල, ගෝත්‍ර භාෂා ආදී විවිධත්වයකින් යුත් පුද්ගල චරිත හා පුද්ගල කණ්ඩායම්වල සම්මිශ්‍රණයක් ලෙස මානව සමාජය නිර්මාණය වීමට බලපා ඇත. මෙවැනි මානව සමාජ තුළ ගොඩනැගී ඇති සංස්කෘතීන්ට අනුව එය නිර්මාණය වන්නේ කෙසේ ද යන්න සංස්කෘතිය පිළිබඳව අර්ථකථනයක් දක්වන ඊ.බී. ටයිලර් "සංස්කෘතිය යනු දැනුම, ඇදහිල්ල, කලාවන්, සාරධර්ම, නීතිරීති, සිරිත්විරිත් හා සමාජගත ජීවියෙකු වශයෙන් මිනිසා උකහා ගත් දක්ෂතා ආදී සියල්ල බව" පවසයි (Tyler, 1871: 166). මෙනයින් සංස්කෘතිය යන්න සමාජ සම්ප්‍රදායක් හෝ උරුමයක් බව පැහැදිලි වෙයි.

උරුමය යන්න පුළුල් අර්ථයකින් හඳුනා ගැනීමේ දී එය ප්‍රධාන වශයෙන් සංස්කෘතික සහ ස්වභාවික යන තේමා ද්විත්වයකට බෙදේ. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ ගල් ආයුධ තාක්ෂණයේ පටන් සංස්කෘතික අභිචාර නිර්මාණය කරන සුසාන, ජනාවාස, ගොඩනැගිලි හා පූර්ව ඓතිහාසික යුගයේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ ඔස්සේ පුළුල් පරාසයක ව්‍යාප්තව පවතින සංස්කෘතික දෑ

සංස්කෘතික උරුමය ලෙස අර්ථකථනය වේ. එමෙන්ම සංස්කෘතික උරුමය යන්නෙන් මිනිසා විසින් තම සංස්කෘතියට හෝ ශිෂ්ටාචාරයට යටත් ව නිර්මාණය කර ඇති අතීතයට අයත් සෞන්දර්යාත්මක, විද්‍යාත්මක හා තාක්ෂණික නිර්මාණ ලෙස වැදගත්, නිර්මාණ හා ස්ථාන සංස්කෘතික උරුමය (Cultual heritage) ලෙස අදහස් කෙරේ (මැන්දිස් සහ ශ්‍යාමලී, 2019ඃ 09). සංස්කෘතික උරුමය නිසැකවම ගොඩනැගිලි සමූහ, ස්මාරක, ඓතිහාසික ස්ථාන හෝ භූමි වශයෙන් වූ භෞතිකමය වස්තු මෙන්ම පාරම්පරික සිරිත් විරිත්, අභිචාර හා භාෂාමය යන අංගයන්ගෙන් සමන්විත ය. සංස්කෘතික උරුමය ස්පර්ශිත සහ අස්පර්ශිත සංස්කෘතික උරුමය ලෙස ප්‍රභේද වේ. අතීත ජනසමාජයේ භෞතික වශයෙන් ස්පර්ශ කළ හැකි මිනිසා විසින් නිර්මාණය කළා වූ ගොඩනැගිලි, ස්මාරක, කරඬු, කාසි, අවි ආයුධ ආදීය ස්පර්ශනීය සංස්කෘතික උරුමය (Tangible heritage) යටතට ගැනේ. මෙය ද චංචල හා නිශ්චල වශයෙන් කොටස් දෙකකට වර්ග කෙරේ. ජනතාවගේ සමාජ විඥානය අස්පර්ශිත සංස්කෘතික උරුමය (Intangible cultural heritage) ලෙස සලකනු ලැබේ (විජේසේකර, 1995ඃ 73). භෞතිකව ස්පර්ශ කළ නොහැකි සිතිවිලි, සංකල්ප, සාම්ප්‍රදායික දැනුම, තොරතුරු ආදිය අස්පර්ශිත සංස්කෘතික උරුමය බවට පෙන්වා දෙයි (මැන්දිස් සහ ශ්‍යාමලී, 2019ඃ 12). මෙම උරුමය ද සොබාදහමේ හා සමාජයේ අභියෝගවලට මුහුණ දීමේ හා දෛනික ජීවිතය තුළ දී තමා විසින් අත්දැකීමට වන සමාජ චර්යා, අගමික, අධ්‍යාපනික, චින්තනය, උත්සව හා සාහිත්‍යය යනාදී අංග සමග බැඳී පවතින බව පැහැදිලි කළ හැකි ය.

**කෑගල්ල දිස්ත්‍රික්කයේ සංස්කෘතික සංචාරක කර්මාන්තය**

අප මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සංස්කෘතික සංචාරක කර්මාන්තය වෙත වන බැවින් ඒ පිළිබඳ විමසීමේ දී ලෝක සංචාරක කර්මාන්තයේ හැසිරීම පිළිබඳව ද අවබෝධයක් තිබිය යුතුය.

සංචාරක ව්‍යාපාරය ලෝකයේ ප්‍රධාන කර්මාන්තයක් ලෙස දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. ඇතැම් රටවල ආර්ථිකමය වශයෙන් 50% කට වඩා වැඩි ප්‍රතිශතයක් ඉක්මවන සංචාරක ව්‍යාපාරය

ඉහළ ආදායම් උත්පාදනය කිරීමට ද සමත්ව ඇත. මේ නිසා ලෝක සංචාරක කර්මාන්තය, සෙසු කර්මාන්තයන් අතර කැපී පෙනෙන වටිනාකමක් උසුලන බව දත යුතු ය. ස්මාරක, ගොඩනැගිලි වැනි දෑ ද්‍රව්‍යමය සංස්කෘතියට වැටෙන ස්පර්ශිත සාධක මෙන්ම නැටුම්, ගැයුම්, වැයුම් කලාව සහ තාක්ෂණය අදිය මිනිසාගේ අස්පර්ශිත සංස්කෘතියට ගැනෙයි. මේ නිසා සංස්කෘතික සංචාරක කර්මාන්තයේ දී (Cultural tourism indusrty) සිදුවන්නේ විශේෂයෙන් ජනතාවගේ විවිධ වූ සංස්කෘතික ලක්ෂණ හා වටිනාකම් පිළිබඳව තොරතුරු, දැනුම සංචාරකයෙකුට ලබා ගැනීමට ඉඩ සැලසීමයි (මැන්දිස් සහ ශ්‍යාමලී, 2019: 79). සංස්කෘතික සංචරණය යන්න නිශ්චිත නිර්වචනයක් ලබා දීමට නුපුළුවන. කෙසේ නමුත් සියලු නිර්වචනයන් තුළනාත්මකව අධ්‍යයනය කර බැලීමේ දී ඒ තුළ ප්‍රධාන කරුණු කිහිපයක් ගැබ්ව තිබේ.

- විවිධ ලක්ෂණ පෙන්නුම් කරන ඉදිකිරීම්, වටිනාකම් ඇති වස්තූන්
- එදිනෙදා ජීවිතයට සමීප සංස්කෘතික වටිනාකම් (විවේකය, සුවපහසුව, පුරුදු ජීවන වෘත්තිය, භෝජන කලාව ආදිය)
- උත්සව සහ සංස්කෘතික ක්‍රියාකාරකම්

එමෙන්ම සංස්කෘතික සංචරණය විවිධ ක්ෂේත්‍ර ගණනාවක් එකතුව නිර්මාණය වී ඇති බව දැක්වේ. ඒ අනුව,

- උරුම සංචරණය (Heritage tourism)
- පුරාවිද්‍යා සංචරණය (Archaeological tourism)
- කලා සංචරණය (Art tourism)
- ස්වදේශීය සංචරණය (Indigenous tourism) යන්න ක්ෂේත්‍රයන් කිහිපයකි.

මේ අනුව සංස්කෘතික සංචාරක කර්මාන්තයේ මූලිකාංග ප්‍රධාන වශයෙන් දෙකකට බෙදා දක්වයි. විවිධ උරුම හා සම්බන්ධව ඇති

සංචරණය උරුම සංචරණ ලෙසත් සමකාලීන සංස්කෘතික නිර්මාණ වන නැටුම්, ගැයුම්, වැයුම්, සාහිත්‍ය, වාස්තුවිද්‍යාව හා තාක්ෂණය ආදිය කලාශිල්ප සංචරණය ලෙසත් සංස්කෘතික සංචරණයේ මූලිකාංග වේ. තව ද සංස්කෘතික සංචරණයේ ද්විතියික අංග නිෂ්පාදන සහ ජීවන රටාව ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. නිෂ්පාදන කර්මාන්තය යනු විලාසිතා, චිත්‍රපට, චිත්‍ර, සන්නිවේදන ආදිය වන අතර ජීවන රටාව යනු විශ්වාස, කෑම පිසීම, ජනශ්‍රැතිය ආදිය ලෙස හැඳින්වේ.

ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය තුළ විවිධ පළාත්, දිස්ත්‍රික්ක ඉලක්ක කරගෙන සංස්කෘතික සංචරණය සහ ස්වභාවික සංචරණය ව්‍යාප්තව ඇත. මෙහිදී කෑගල්ල ප්‍රදේශය ද සංචාරක ව්‍යාපාරයේ දී ප්‍රමුඛස්ථානයක් හිමිකරගෙන තිබේ. අදවන විට පින්නවල ආශ්‍රිත සංචාරක කලාපය, කිතුල්ගල ආශ්‍රිත සංචාරක කලාපය වශයෙන් ප්‍රධාන සංචාරක කලාප දෙකක් ස්ථාපිත ව තිබේ. ඒ අනුව පින්නවල එළිමහන් සත්වෝද්‍යානය, දැදිගම, බෙලිගල, වට්ටාරම, කිතුල්ගල බෙලිලෙන ආදී සංස්කෘතික සංචරණ ස්ථානත් අසුපිනි ඇල්ල, රිකිලි ඇල්ල, කිතුල්ගල (White water rafting නැමැති ක්‍රීඩාව) ප්‍රදේශයන් ස්වභාවික සංචරණයටත් දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක්ව තිබේ.

මෙසේ කෑගල්ල දිස්ත්‍රික්කය පුරා සංස්කෘතික සංචාරක ස්ථානයන් බොහොමයක් දක්නට ලැබෙන අතර එම ස්ථාන අතුරින් තෝරාගත් ස්ථාන ආශ්‍රයෙන් සංචාරක කර්මාන්තය හා සංචාරක ප්‍රවර්ධන වැඩපිළිවෙල පිළිබඳව පැහැදිලි කළ යුතුවේ.

අධ්‍යයන ක්ෂේත්‍රයේ ඇති දැදිගම කොටවෙහෙර, දැලිවල කොටවෙහෙර, වට්ටාරම, බෙලිගල, දෙවනගල, ප්‍රාග් ඓතිහාසික යුගය නියෝජනය කරන කිතුල්ගල බෙලිලෙන සහ අලුත්නුවර දේවාලය යන ස්ථාන සංස්කෘතික සංචාරක කර්මාන්තයෙහිලා සැලකිය යුතු දායකත්වයක් සැපයීමට පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, ආගමික, සමාජීය අගයන්ගේ සුවිශේෂත්වය හේතු වී ඇත්ද නැද්ද යන්න සැකෙවින් විමසා බැලේ. එමෙන්ම උක්ත සංචාරක කර්මාන්තයෙහිලා විශේෂිත ස්ථාන කිහිපයක් හඳුනා ගැනීම, අතීත ගමන් මග, වත්මන් ස්වභාවය හා SWOT විශ්ලේෂණයට අනුව ගැටලු, දුර්වලතා, අවස්ථා, තර්ජන

පිළිබඳව විමර්ශනය කෙරේ SWOT ලෙස සංක්ෂිප්ත කරනුයේ ආයතනික Strengths, Weaknesses, Opportunities And Threats හඳුනාගැනීම සහ ඒවා විශ්ලේෂණය කිරීමේ රාමුවකි. ඒ අනුව සාර්ථක සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමට අදාළ ස්ථානයන් හඳුනාගනිමින් ඒවායෙහි ඇති හැකියාව, විශේෂත්වය අවබෝධ කොටගත යුතුය.

සංස්කෘතික සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාව, ඉන්දියාව වැනි රටවල ගෝලීය සංචාරක කර්මාන්තයෙහිලා ඉහළ ස්ථානයක පවතින බව සඳහන් කළ යුතු ය. ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයන් අතරින් ලෝක උරුම හයක් (06) මෙරට විද්‍යාමාන වේ. එනම්,

1. අනුරාධපුර පූජනීය නගරය
2. පොළොන්නරුව පැරණි නගරය
3. සීගිරිය බලකොටුව
4. මහනුවර පූජා නගරය
5. ගාල්ල පැරණි නගරය
6. රංගිරි දඹුල්ල ලෙන් පරිශ්‍රය යනාදිය ප්‍රමුඛ වේ.

මෙම ස්මාරක, භූමි ලංකාවේ විවිධ පළාත් මට්ටමින් පිහිටා ඇති අතර ශ්‍රී ලංකිකයන් වන අපට තවත් මෙවන් උරුම රැසක් මෙරටට උරුමව ඇති බව ස්වාභිමානයෙන් කිව යුතුය. ප්‍රස්තුත කාරණාව දෙස අවධානය යොමු කිරීමේ දී කෑගල්ල දිස්ත්‍රික්කයේ අධ්‍යයන ක්ෂේත්‍රයන් වන සංස්කෘතික උරුමයන් අතරින් යම්තාක් දුරට හෝ සංචාරක ගමනාන්ත බවට පත්ව ඇති සංස්කෘතික ස්ථාන කිහිපයකි. එනම්,

1. දැදිගම කොට වෙහෙර
2. වට්ටාරම ශ්‍රී අරහන්ත මලියදේව රජමහා විහාරය
3. කිතුල්ගල බෙලිලෙන යනාදිය ඒ අතර වේ.

මෙම ස්ථාන හැරුණු කොට අධ්‍යයන ක්ෂේත්‍රයෙහි කිසිදු සංචාරක ප්‍රවර්ධනයක් නොකළ ගමනාන්තයක් නොවන සංස්කෘතික ස්ථාන කිහිපයකි. ඒ අතර,

4. දැලිවල කොටවෙහෙර

5. බෙලිගල රජමහා විහාරය

6. දෙවනගල රජමහා විහාරය

7. අලුත්නුවර දැඩිමුණ්ඩ දේවාලය යන ස්ථාන පෙන්වා දිය හැකිය.

සඳහන් කරන ලද සහ කෑගලු දිස්ත්‍රික්කයේ සියලු පුරාවිද්‍යාත්මක ස්මාරක, භූමි මාවනැල්ල, අරණායක, වරකාපොළ, රඹුක්කන, යටියන්තොට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටා ඇති අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ සහ මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ක්‍රියාත්මක වේ.

හුදෙක් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය මෙතෙක් මුළුමනින්ම පාහේ සංස්කෘතික සංචාරක අංශ මගින් ඇද ගනු ලැබී ඇත. නමුත් එය ද ලංකාවේ දැනටමත් ප්‍රකටව පවතින ලෝක උරුම හා තදාසන්න සංස්කෘතික ස්ථානවලට පමණක්, සංචාරක ගමනාන්ත සීමා වී ඇත. එහෙත් සබරගමුව කෑගල්ල දිස්ත්‍රික්කය ආශ්‍රිත සංස්කෘතික උරුමයන් විසිරී පැතිරී පවතින බව සංචාරකයන් දැනුවත් කොට තිබේද ඒවාට ශ්‍රී ලංකාවේ සංචාරක ආයතන මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද සහ පවතින සංස්කෘතික උරුමයන් සංචාරක ගමනාන්තයන් බවට පත් කරන්නේ කෙසේද යන ගැටලුවලට විසඳුම් මෙහි විමර්ශනය කිරීමට SWOT විශ්ලේෂණයේ උපයෝගීතාවය ප්‍රමුඛ වේ. මෙසේ අධ්‍යයන ක්ෂේත්‍රයේ සංස්කෘතික උරුමයන්, සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ දී මෙන්ම අනාගත ඉලක්ක, සැලසුම් සංචාරක ව්‍යාපාරය තුළ ඉටු කර ගැනීමේ දී එයට ඇතිවන ගැටලු, තර්ජන, අභියෝග මඟහරවා ගනිමින් සාර්ථක ගමනාන්තයක් සංචාරකයා වෙත ලබාදීමට SWOT විශ්ලේෂණ න්‍යාය භාවිත කරගනු ලැබීමත් සමග මෙමගින් ස්ථානීය සංචාරක කර්මාන්තයේ සාර්ථකත්වය ළඟා කරගැනීමට පුළුවන.

ශක්තීන් - ශක්තිමත් සන්නාමයක්, දක්ෂ ශ්‍රම බලකායක් මෙන්ම තාක්ෂණයක් වැනි තඟකාරී සමාන ක්ෂේත්‍රයන් තුළ තරඟකරුවන්ට වඩා ශක්තිමත් අභ්‍යන්තර සාධක.

දුර්වලතා - දුර්වල නායකත්වය, යාවත්කාලීන නොවීම් හෝ සීමිත සම්පත් වැනි සමාන ක්ෂේත්‍රයන්හි තරඟකරුවන්ට සාපේක්ෂව සංවිධානය අවාසිදායක තත්ත්වයකට පත් කරන අභ්‍යන්තර සාධක.

අවස්ථා - නව්‍ය වෙළඳපොළවල්, නව තාක්‍ෂණය හෝ රෙගුලාසිවල වෙනස්වීම් වැනි එහි ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා සංවිධානයකට ප්‍රයෝජන ගත හැකි බාහිර සාධක.

තර්ජන - ක්ෂේත්‍රය වෙත එල්ලවන භෞතික හා අභෞතික බලපෑම්, තරඟකාරීත්වය හෝ සංචාරක ආකර්ෂණවල වෙනස්වීම් වැනි කර්මාන්තයේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑ හැකි බාහිර සාධක(https://www.mindtools.com/amtbj63/swot-analysis (Accessed: April 23, 2023).

**දැදිගම කොට වෙහෙර**

දැදිගම කොටවෙහෙර කැණීමෙන් හමු වූ ඇත් පහණ අද වන විට ලෝකප්‍රකට පුරාවස්තුවකි. මෙම වසර දහස් ගණනක අතීතයකට අයත් ඇත් පහණ අතිශය දියුණු තාක්ෂණයක් භාවිතයෙන් නිම වූවකි. දැදිගම කොටවෙහෙර කැණීම් මගින් හමු වූ වටිනා පුරාවස්තු ලෝක මට්ටමින් ප්‍රසිද්ධ කිරීම තුළ සංචාරකයන්ගෙන් ස්ථානීය ආකර්ෂණය ගොඩනැගීමට හැකියාව තිබේ. කෑගල්ල නගරාසන්නව පැවතීම, ගමනාගමන පහසුකම ද හේතුවෙන් සංචාරකයන් ගෙන්වා ගැනීමට ඇති හැකියාවත් රථ වාහන ගාල් කිරීමේ ඇති හැකියාව, වෙළඳ පහසුකම්, යටිතල පහසුකම් සහ කෞතුකාගාරයන් පැවතීම වැනි ශක්තීන් හා අවස්ථා පෙන්වාදිය හැකි ය.

දැදිගම කොටවෙහෙර පුරාවිද්‍යා ස්ථානය තුළ පවත්නා දුර්වලතා සහ තර්ජන පිළිබඳ විමසීමේ දී ප්‍රධාන වශයෙන් ප්‍රමාණවත් යටිතල පහසුකම්වල හිඟකම හෙවත් සංචාරක පහසුකම් විධිමත් නොවීම, නිසි ආරක්ෂක ක්‍රියාවලියක් නොමැතිකම, සොර සතුරන්ගේ

මංකොල්ලයට ග්‍රහණය වීම, නිසි නඩත්තු කටයුත්තක් නොවීම, ප්‍රමාණවත් තරම් ප්‍රසිද්ධියක් නොමැතිකම, සංචාරකයින් පිළිගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් නොමැතිකම, සංචාරක ගමනාන්ත සෙවීම් තුළ ප්‍රමුඛ නොවීම සහ ස්ථානීය වශයෙන් පවතින ආරක්ෂාවේ අඩුව දැඩි දුර්වලතා සහ තර්ජන ලෙස පෙන්වාදිය යුතු ය.

### දැලිවල කොට වෙහෙර

වර්තමානය වන විට බෞද්ධ ලෝකයේ ම පුරාවිද්‍යාත්මක හා ඓතිහාසිකමය වටිනාකමකින් පිළිගැනෙන දැලිවල කොටවෙහෙරින් හමුවූ පුරාවස්තු අතරින් ලෝහ කරඬුව ඔතා තිබූ සේද රෙදි කැබැල්ල සහ තවත් පුරාවස්තු රැසක් මෙහි වටිනාකම් පිළිබිඹු කරයි.

දැලිවල කොටවෙහෙර මාර්ග පහසුකම් සහිත සුවිශේෂී ප්‍රදේශයක පිහිටා තිබීම සංචාරක ගමනාන්තයෙහිලා අතිශය වැදගත් වේ. විශේෂයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ පින්නවල සත්ත්ව උද්‍යානය, අලි අනාථාගාරය සංචාරක කර්මාන්තයේ මර්මස්ථානයක් බව අප දන්නා කරුණකි. මේ ස්ථානයට තදාසන්නව දැලිවල කොටවෙහෙර පිහිටා තිබීම සංචාරකයන් ගෙන්වා ගැනීමට ඇති හැකියාවත් පෙන්නුම් කරයි. එමෙන්ම රථ වාහන ගාල් කිරීමේ ඇති හැකියාව, වෙළඳ පහසුකම් සහ කෞතුකාගාරක් පැවතීම වැනි ශක්තීන හා අවස්ථා ද මෙහි දක්නට ලැබේ.

මෙහි පවත්නා යටිතල පහසුකම්වල හිඟකම, නිසි ආරක්ෂක ක්‍රියාවලියක් නොමැතිකම, සොර සතුරන්ගේ මංකොල්ලයට ග්‍රහණය වීම, සංචාරක පහසුකම් විධිමත් නොවීම, දැලිවල කෞතුකාගාරයේ ආරක්ෂකයෙකු හෝ ආරක්ෂක පද්ධතියක් නොමැතිකම, වෙළඳ ප්‍රවර්ධනයක් නොමැතිකම, සංචාරකයින් පිළිගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් නොමැතිකම, සංචාරක ගමනාන්ත සෙවීම් තුළ ප්‍රමුඛ නොවීම මෙන්ම විශේෂයෙන් දැලිවල කොටවෙහෙර කැණීමෙන් හමු වූ පුරාවස්තු මෑතක දී නිදන් සොරුන්ගේ ග්‍රහණයට ලක්වීම වැනි කරුණු ස්ථානීය වශයෙන් පවත්නා දුර්වලතා සහ තර්ජන ලෙස පෙන්වාදිය යුතු ය.

### වට්ටාරම රජමහා විහාරය

වට්ටාරම ශ්‍රී අරහන්ත මලියදේව රජමහා විහාරය අදටත් සංචාරක ආකර්ෂණය දිනාගෙන ඇති වැදගත් බෞද්ධ සංස්කෘතික ස්ථානයකි. මෙරට අවසන් මහ රහතන් වහන්සේ යැයි සැලකෙන මලියදේව මහතෙරුන් වැඩ විසූ ඓතිහාසික පුදබිම මෙයයි. මේ නිසා ඓතිහාසික, ආගමික, පුරාවිද්‍යාත්මක වශයෙන් ද ස්ථානීයව පවත්නා නටඹුන් සංස්කෘතික සංචරණයේ දී වැදගත් වේ. මෙම ස්ථානයේ පුරාවිද්‍යා නිලධාරීන් විසින් ස්ථානයේ කටයුතු පවත්වා ගැනීම, මහා මාර්ගයේ ආසන්නයේ පිහිටීම, පුළුල් භූමියක් වීම නිසා නැරඹීමට ස්මාරක රැසක් භූමිය තුළ පැවතීම, යටිතල පහසුකම් පැවතීම, පර්යේෂකයන් සඳහා බාධාවකින් තොරව විවෘත වීම යනාදිය සංචාරක ප්‍රවර්ධනයේ දී ඇති ශක්තීන් සහ අවස්ථා බව කිවමනා ය. මේ අනුව පුරාවිද්‍යාත්මක සංචරණයේ දී මෙන්ම ආගමික සංචණරයේදී වැදගත් සන්ධිස්ථානයක් වට්ටාරම රජමහා විහාරය හිමිකර ගනී.

වට්ටාරම රජමහා විහාරස්ථානයේ භූමිය පුළුල් වීම හේතුවෙන් පුරාවිද්‍යාත්මක නඩත්තු ක්‍රියාවලිය මෙන්ම භූමියේ පවිත්‍රතාවය සිදු කරලීමට නොහැකි තත්වයක් උදාවීම ප්‍රධාන දුර්වලතාවකි. එසේම දේශීය සංචාරකයන් බහුලව පැමිණීම හේතුවෙන් උරුම ස්ථානයට ඇතිවන හානිය සහ ස්මාරක නඩත්තු නොකිරීම වැනි හේතුන් නිසා ඇතැම් පුරාවිද්‍යාත්මක ස්ථාන, ස්මාරක විනාශ ස්වභාවයට පත්වීම වැනි කරුණු තර්ජන බව කිවයුතු ය.

### බෙලිගල රජමහා විහාරය

ශ්‍රී ලාංකිකයන්ගේ පමණක් නොව බෞද්ධ ලෝකයේ මුදුන් මල්කඩක් වූ දළදා වහන්සේ සුරැකිව තිබූ ස්ථානයක් ලෙස බෙලිගල ප්‍රකට ය. බෙලිගල ආශ්‍රිත පුරාවිද්‍යාත්මක නටබුන් පදනම් කරගනිමින් මෙහි පුරාවිද්‍යාත්මක සංචරණ වෙළඳපොළක් ලෙස ගැනීමේ හැකියාව ඇත. කෑගල්ල නගරයේ සිට වැඩි දුරක් නොවීමත් නිසා ගමනාගමන පහසුකම අතින් ද බෙලිගල සංචරණය කිරීම මගින් සංචාරකයන්ට තදාසන්න ප්‍රදේශවල මාම්පිට, බිසෝවෙල වැනි සංචාරක ස්ථාන ද නැරඹීමේ හැකියාව පවතී.

මෙම ස්ථානය සංචාරක ව්‍යාපාරයෙහිලා වර්ධනයක් නොදක්නේ යටිතල පහසුකම් නොමැතිකම, පොදු පවිත්‍රතාවයක් නොමැතිකම, භූමියේ සත්‍යතාවයට හානි වීම, ස්ථානය පිළිබඳ ප්‍රවර්ධන කටයුතු නොමැතිකම, සංචාරකයන් පිළිගැනීමට සුදුසු වැඩපිළිවෙළක් නොමැතිකම, ආරක්ෂක ක්‍රියාවලියක් නොමැතිකම වැනි කරුණු ස්ථානීය වශයෙන් පවත්නා දුර්වලතා සහ තර්ජන ලෙස පෙන්වාදිය යුතු ය.

**දෙවනගල රජමහා විහාරය**

දේශීය වශයෙන් ජනප්‍රිය ඓතිහාසික ස්ථානයකි දෙවනගල. ධාතුසේන මහ රජ (ක්‍රි.ව. 460-479) සමයේ අටළොස් වෙහෙරක් මෙහි කරවූ බව මහාවංසය සඳහන් කරයි (ම.වං; 38ඃ 46-51). තව ද රතනාලංකාර නම් හිමිනමක් දෙවනගල වැඩවසන සමයේ උන්වහන්සේගේ අවවාද අනුශාසනා ඇතිව දෙල්ගමුවේ තිබූ දළදා වහන්සේ හා ත්‍රිපිටක පොත්පත් ඇතෙකු පිට තබා මැද මහනුවරට ගෙන ගොස් තිබේ. මෙවැනි ඓතිහාසික තොරතුරු රැසකුත් ආකර්ෂණීය භූගෝලීය පිහිටීමත් දෙවනගල දක්නා ලැබෙන විශේෂත්වයන් ය. සමස්ථයක් වශයෙන් ගත් කළ මෙම ස්ථානයෙහි පවතින ශක්තීන් හා අවස්ථා අතර පුරාවිද්‍යාත්මක, ආගමික හා සංස්කෘතික වටිනාකම මෙන්ම පාරිසරික සුන්දරත්වය ප්‍රධාන වේ. මෙම හේතු කරුණු පාදක කරගනිමින් දෙස් විදෙස් සංචාරක ආකර්ශනය මෙම ස්ථාන වෙත ලබාගැනීමේ ශක්‍යතාව පවතී.

සංචාරක ව්‍යාපාරයෙහිලා දුර්වලතා හා තර්ජන පිළිබඳ විමසීමේ දී විශේෂයෙන් දෙවනගල පුරාවිද්‍යාත්මක හා බෞද්ධාමික පුදබිම මිනිසුන් විසින් බලහත්කාරයෙන් අත්පත් කරගැනීම ඛේදවාචකයකි. පොදුවේ ගත්විට මෙම ස්ථානයේ පවතින ප්‍රබලම තර්ජනය වන්නේ නිධන් හෑරීම සහ පුරාවස්තු සොරා ගැනීමයි. එමෙන්ම නිසියාකාර සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමට තිබිය යුතු යටිතල පහසුකම්වල හිඟකම, ගමනාගමන පහසුකම් නොමැතිකම, ආරක්ෂක ක්‍රියාවලියක් නොමැතිකම, ඇතැම් නෂ්ටාවශේෂ නිසියාකාර සංරක්ෂණයකට භාජනය නොකිරීම, සංචාරකයන් පිළිගැනීමට සුදුසු වැඩපිළිවෙළක් නොමැතිවීම වැනි දුර්වලතා සහ තර්ජන බව පෙන්වාදිය යුතු ය.

**අලුත් නුවර දේවාලය**

දේශීය ජනතාවගේ ආගමික පූජනීය ස්ථානයක් වීමත් පුරාවිද්‍යාත්මක වටිනාකම හා ඓතිහාසික වටිනාකම අතින් ද ආගමික ප්‍රසිද්ධිය මත එදිනෙදා පැමිණෙන දේශීය ජනතාව නිසා පවතින යටිතල පහසුකම්, නවාතැන් පහසුකම්, ගමනාගමනයට පහසුකම්, ආරක්ෂාව වැනි ශක්තීන් නිරන්තරයෙන් පවත්වාගෙන යනු ලබයි. එසේම මහනුවර නගරයට යන මාර්ගය ආසන්නයේ පිහිටා තිබීම, තදාසන්නව පිහිටි සංචාරක ස්ථාන නැරඹීමට ඇති හැකියාව වැනි අවස්ථා සහ ශක්තීන් අලුත්නුවර දේවාල හා සම්බන්ධව පවත්නා බව කිවහැකි ය. කෙසේ නමුත් ආගමික වශයෙනුත් පුරාවිද්‍යාත්මක වශයෙනුත් ඓතිහාසික අලුත්නුවර දැඩිමුණ්ඩ දේවාල භූමියේ විධිමත් සංචාරක වැඩපිළිවෙළක් නොමැතිකම මේතාක් ඇති දුර්වලතාවයකි. මාර්ගෝපදේශයක් හෝ මාර්ගෝපදේශකයන් නොමැතිකම, සංචාරක පහසුකම් විධිමත්ව සකස් නොවීම, භූමියේ සත්‍යතාවට හානි වන ඉදිකිරීම්, ගවේෂණ සඳහා පැමිණෙන සංචාරකයන්ට ඒ සඳහා ඇති අවස්ථා හිගකම, සංචාරකයන් පිළිගැනීමට සුදුසු වැඩපිළිවෙළක් නොමැතිකම දුර්වලතාවයන් ය. එසේම ස්ථානීය වශයෙන් පවත්නා තර්ජන වශයෙන් දේශීය සංස්කෘතිකාංගවලට බලපෑම් එල්ල වීම, දේශීය සංචාරකයන් හෝ බැතිමතුන්ගේ පැමිණීමත් නිසා උරුමය ස්ථානයන්ට වන හානිය වැනි තර්ජන පෙන්වාදීමේ හැකියාව පවතී.

කිතුල්ගල බෙලිලෙන ප්‍රාග් ඓතිහාසික ජනාවාසකරණයේ දී ආසියාතික කලාපයේ පළමු තැනක් ගන්නා පාහියංගල හා සමකාලීන ජනාවාස භූමියකි. ඒ අනුව එහි ඇති ඓතිහාසිකමය අගයන් පුරාවිද්‍යාත්මක වශයෙන් හමුවන සාධක මෙන්ම ස්වභාවික පරිසරයක පිහිටීම වැනි ස්ථානීයව පවත්නා ශක්තීන බව කිවමනා ය. එමෙන්ම බෙලිලෙන ආශ්‍රිතව පවතින අවස්ථා ලෙස දෙස් විදෙස් සංචාරකයන්ගේ අතිශය ආකර්ෂණයට පත් වයිට් වෝටර් රාෆ්ටින් (White water rafting) නැමැති ක්‍රීඩාව මේ ආසන්නයේ පැවතීම හා කිතුල්ගල ප්‍රදේශය අන්තර්ජාලය හරහා නිරන්තරයෙන් ප්‍රවර්ධනය සිදුවීම වැනි කරුණු ශක්තීන් සහ අවස්ථා වශයෙන් හඳුන්වාදිය හැකි ය. එමෙන්ම මෙම සංස්කෘතික ස්ථානය ස්වභාවික කඳුකර භූමියක පිහිටා තිබේ. මේ නිසා ස්ථානයට ඇතිවන තර්ජන සුලබ

වේ. ඒ අතර ස්වභාවික විපත්, දේශීය සංචාරකයන් මෙන්ම විදේශීය සංචාරකයන්ගේ ද තර්ජන ඇතිවිය හැකි ය. එසේම ස්වභාවික පරිසරයත් සංස්කෘතික පරිසරයත් අතර පවත්නා ශාක සහ සත්ත්ව කොටසට හානිය පැමිණීම ප්‍රධාන තර්ජන ලෙස පෙන්වා දීමට පුළුවන. ස්ථානයේ යටිතල පහසුකම් ඉදිකර ඇති නමුත් ඒවා විනාශයට පත්වීම, ස්ථානයේ නඩත්තු ක්‍රියාවලියක් නොමැතිකම, ස්ථානය පිළිබඳ ප්‍රමාණවත් තරම් ප්‍රවර්ධනයක් නොවීම, භූමියේ සත්‍යතාවයට හානිවන පරිදි වූ ඉදිකිරීම්, ගමනාගමන අපහසුතාවයන්, සංචාරකයන් පිළිගැනීමට සුදුසු වැඩපිළිවෙළක් නොමැතිවීම මෙන්ම ආරක්ෂක ක්‍රියාවලියක් නොමැතිවීම වැනි කරුණු සමස්තයක් වශයෙන් දුර්වලතා සහ තර්ජන ලෙසට පෙන්වාදිය යුතු ය.

### උරුම කළමනාකරණය සහ සංචාරක ප්‍රවර්ධනය

වර්තමානය වන විට ලෝකයේ සීඝ්‍රයෙන් ම වර්ධනය වන අංශය ලෙස පිළිගනු ලබන්නේ සංචාරක කර්මාන්තය යි. සියයට පහක් (5%) අටක් (8%) ක් අතර ඉහළ වර්ධන අනුපාතයක් හිමි අනෙකුත් කර්මාන්තවලට සාපේක්ෂව අවම පිරිවැයක් යොදා ගෙන දියුණු කළ හැකි කර්මාන්තයක් ලෙස සංචාරක කර්මාන්තය හැඳින්විය හැකි ය. බොහොමයක් නූතන ආර්ථිකයන්හි සංවර්ධන උපාය මාර්ගයක් ලෙස සංචාරක කර්මාන්තය යොදාගනු ලබයි. නමුත් සංචාරක කර්මාන්තයට අදාළ සංවර්ධන උපායමාර්ග එක් එක් රටවලට ආවේණික වන බැවින් තම රටට ආවේණික උපාය මාර්ග තෝරා ගැනීම අත්‍යාවශ්‍ය කරුණකි. ශ්‍රී ලංකාව වැනි ආර්ථික වශයෙන් එතරම් ශක්තිමත් නොවූ රටක් තම දේශීයත්වය පදනම් කරගත් සංචාරක ව්‍යාපෘතින් යොදා ගැනීම වඩාත් යෝග්‍ය වන අතර කෑගල්ල දිස්ත්‍රික්කයේ සංස්කෘතික සංචාරක කර්මාන්තයෙහිලා ප්‍රදේශයේ විසිරී පවතින උරුම ස්ථාන සංචාරක ගමනාන්තයන් බවට පත් කිරීමට ප්‍රථම ඒවායේ ආරක්ෂාව සැලසිය යුතු ය. මේ සඳහා උරුම ස්ථානයන් නියමාකාර සංරක්ෂණයකට භාජනය කිරීම අත්‍යවශ්‍ය වේ. උරුමය සංරක්ෂණය යන්නෙන් අදහස් කෙරෙන්නේ රටක ප්‍රජාවක අතීතය නියෝජනය කරන සංස්කෘතික, ඓතිහාසික හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය හා ආරක්ෂා කිරීමේ ක්‍රියාවලිය යි. එහිදී ලේඛනගත කිරීම (Documentation), ආරක්ෂා කිරීම (Preservation), පුනරුත්ථාපනය (Restoration), අනුවර්තනය

හෝ නැවත භාවිත කිරීම (Adaptive reuse), අධ්‍යාපනය හා ව්‍යාප්තිය (Education and outreach) යන කරුණු පාදක කරගනිමින් උරුමය කළමනාකරණය කළ යුතුය.

ලංකාවේ සංචරණය සම්බන්ධයෙන් සියලු කටයුතු සිදුකරන සංචාරක ආයතන ලෙස ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක හා හොටල් කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යංශයයන් කෑගලු දිස්ත්‍රික්කයේ උරුමයන්ගේ ආරක්ෂාව හා පවත්වා ගෙන යාමේ නෛතික පසුබිම නියාමනය කිරීමට භාවිත රාජ්‍ය ආයතනක කිහිපයකි. ඒ අතර ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, නාගරික සංවර්ධන අධිකාරිය, වනජීවී දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, කෞතුකාගාර දෙපාර්තමේන්තුව, සිවිල් ආරක්ෂක අංශය, බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය යනාදී ආයතන මගින් පවත්නා උරුමයන් ආරක්ෂා කොට ඒවායේ නෛතික කටයුතු පවත්වා ගනිමින් උරුමයන් කළමනාකරණය කොට සංචාරක ප්‍රවර්ධන වැඩපිළිවෙලක් දියත් කළ යුතුය.

මෙහි මූලික පරමාර්ථය වනුයේ කෑගලු දිස්ත්‍රික්කයේ සංස්කෘතික උරුමයන් දෙස් විදෙස් සංචාරකයන් උදෙසා ප්‍රදානය කිරීමට යෝජිත සැලසුමක් ඉදිරිපත් කිරීම වන අතර සාමාන්‍යයෙන් ව්‍යාපෘතියක, ආයතනයක හෝ ව්‍යාපාරයක කාර්යයන් ඉටු කිරීමේ දී එහි අරමුණු සාක්ෂාත් කරගැනීමට එහි පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන වෙත අවධානය යොමු කළ යුතුව තිබේ. ඉන් අනතුරුව සංචාරක කර්මාන්තය වැනි ව්‍යාපාර තුළ දී සංස්කෘතික සංචාරක ගමනාන්තයට සිදුවිය හැකි අයහපත් බලපෑම් අවම කර ගනිමින් උපායක්‍රමික කළමනාකරණය (Strategy management) ඔස්සේ සංචාරක ආකර්ෂණය වර්ධනය කිරීමේ හැකියාව සලකා බලනු ලැබේ. මේ සඳහා සංචාරක ස්ථානය මෙන්ම සංචාරකයාගේ වර්ධනයට හිතකර පරිදි නිසි උරුම කළමනාකරණ සැලැස්මක් හෝ යෝජනාවන් සකස් කරනු ලබයි.

1. සංචාරකයින් හඳුනාගැනීම.

2. සංචාරක සැලසුම් ක්‍රියාවට නැංවීම.

3. උරුම ස්ථාන ප්‍රසිද්ධියට පත් කිරීම් හා සංචාරකයින් දැනුවත් කිරීම.

4. සංචාරකයින් පිළිගැනීම.

5. සංචාරකයින්ට ආරක්ෂාව සැලසීම.

6. සංචාරක ප්‍රවේශ පත්‍ර හා යටිතල පහසුකම් ලබාදීම.

7. මාර්ගෝපදේශ සිතියම්/ අත් පත්‍රිකා සහ උපදේශක සේවාව.

දක්වන ලද කරුණු හුදෙක් උරුම ස්ථාන සංචාරක ගමනාන්තයන් ලෙස උත්පාදනය කිරීමට ක්‍රියාත්මක කළ හැකි සැලසුම් යෝජනාවක් ලෙස සැලකුව මනා ය (සුමංගල හිමි, 2020: 65-77). තව ද සංස්කෘතික උරුම සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීමට අනුගමනය කළ හැකි ක්‍රමවේද කිහිපයක් ලෙස මාර්ගෝපදේශ සංචාරය (Guided Tours), ස්වයං මාර්ගෝපදේශ සංචාරය (Self Guided Tours), උරුම ප්‍රදර්ශන මගපෙන්වීම් (Haritage Trails), සංස්කෘතික සිදුවීම් සහ උත්සව (Cultural Events and Festivals), අතත්‍ය චාරිකා (Virtual Tours), සංස්කෘතික අත්දැකීම් (Cultural Experience), කෞතුකාගාර ප්‍රදර්ශනය (Museum Exhibitions) යනාදිය පෙන්වාදිය හැකි ය. තව ද විශේෂ වශයෙන් අතත්‍ය චාරිකා වැනි නවීන තාක්ෂණික ක්‍රියාවලියක් දියත් කිරීමට ලංකාව වැනි රටකට ඇති පහසුකම් අවම විය හැක. නමුත් ලෝකය සීග්‍රයෙන් දියුණුවෙමින් පවතී. අප ද සංස්කෘතික සංචාරක කර්මාන්තය පමණක් නොව සංචාරක කර්මාන්තය ම නව මානයකට රැගෙන යාමට නම් මෙවැනි නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිතයට ගෙන ක්‍රියාත්මක කිරීම සිදුවිය යුත්තකි.

සමස්ත කරුණු අධ්‍යයනයේ දී සංචාරකයාට සංස්කෘතික උරුම ස්ථානයක සංචරණයට, ගවේෂණයට හා අත්දැකීම් බෙදා ගැනීමට විවිධ ක්‍රම සහ යෝජනා ඉදිරිපත් කළ හැකි ය.

**නිගමනය**

ගෝලීයව ඉන්දියාව හා ශ්‍රී ලංකාව සංස්කෘතික සංචාරක කර්මාන්තයේ ඉහළ ම ස්ථානයක සිටී. එනමුත් රටක පවතින ජාතික

අනන්‍යතාව තවත් රටක ජාතික අනන්‍යතාව සමග සාපේක්ෂව වෙනස් සහ සමාන බවක් පෙන්වයි. ඒ සඳහා ස්වාභාවික හෝ මානව නිර්මිත අතීතය පැරැන්නන් විසින් වර්තමානයට දායාද කොට ඇති අතර එම ජාතික උරුම ශ්‍රී ලාංකීය ජාතික අනන්‍යතාවයේ කදිම නිදසුනකි. මේ නිසා පවතින උරුම නිවැරදිව කළමනාකරණය කිරීම, සංස්කෘතික උරුමයත් සංචාරක කර්මාන්තයත් අතර සම්බන්ධතාව තීව්‍ර කිරීමට හේතු පාදක වේ.

මෙම ලිපිය තුළින් කෑගල්ල දිස්ත්‍රික්කයේ සංස්කෘතික උරුමවල වටිනාකම පෙන්වා දෙමින් ඓතිහාසිකමය, පුරාවිද්‍යාත්මක මෙන්ම එම උරුමයන්හි වත්මන් ස්වභාවය පෙන්වා දී ඇත. එසේම සංස්කෘතික උරුමයන් නිසි කළමනාකරණයකින් තොරවීම නිසා ඊට එල්ල වන ස්වාභාවික හා මානව බලපෑම් නිශ්චිතව හඳුනාගෙන ක්‍රමානුකූල සංචාරක ගමනාන්ත ලෙස නොපවතින සංස්කෘතික උරුමයන් දියුණු කරලීමට ප්‍රායෝගික පැතිකඩක් මෙහි දී සාකච්ඡා කොට තිබේ.

ශ්‍රී ලංකාවේ සබරගමු පළාතට අයත් කෑගල්ල දිස්ත්‍රික්කයේ විශේෂ වශයෙන් සාකච්ඡාවට බඳුන් කළ සංස්කෘතික උරුමවලට සාපේක්ෂව දිගු අතීතයකට හිමිකම් කියන ප්‍රදේශයේ අනිකුත් උරුමයන් පිළිබඳවත් ඒ හා සමාන සැලකීමකට නතු කොට කෑගල්ල දිස්ත්‍රික්කය සංස්කෘතික සංචාරක කර්මාන්තයයෙහිලා ඇති අඩුපාඩු, ගැටලු, අභියෝග නිරාකරණය කරගනිමින් උරුමය කළමනාකරණය කරගැනීම හා සංචාරක ව්‍යාපාරය යන අවියෝජනීය විෂයයන් පිළිබඳ අවබෝධය පුළුල් කර ගැනීමට මෙම ලිපිය හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**කෙටි යෙදුම්**

ම.වං; - මහාවංශය

කෑ.වි; - කෑගලු විත්ති

කෑ.පු; - කෑගලු පුරාවත

ස.වං.ක; - සබරගමුව වංශ කථාව

ක්‍රි.ව; - ක්‍රිස්තු වර්ෂ

ක්‍රි.පූ; - ක්‍රිස්තු පූර්ව

SWOT - Strengths, Weaknesses, Opportunities and Threats

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍රය


*උභය පූර්ණ සහිතො මහාවංසො,* (උභපුම); බුද්ධදත්ත හිමි, පොල්වත්තේ; (1959). (සංස්)., ඇම්. ඩී. ගුණසේන සහ සමාගම; කොළඹ.

*ධාතු වංශය;* පියරතන ස්ථවිර, මකුළුදූවේ; (1941), සීමාසහිත ඇම්. ඩී ගුණසේන සමාගම; කොළඹ.

*මහාවංශය;* සුමංගල හිමි, බටුවන්තුඩාවේ, දේවරක්ඛිත, (1996). (සංස්). සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ; කොළඹ 10.


### ද්විතීයික මූලාශ්‍රය


ඇඳගම, පණ්ඩුල; (සංස්). (2003). *සබරගමු වංශ කතාව 1 වෙළුම - 3 වෙළුම,* සබරගමුව පළාත් සභාව; දෙහිවල.

ගුණසේකර, බන්දුසේන; (සංස්). (1986). *තිසර සන්දේශය,* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ; කොළඹ 10.

ගුණවර්ධන, ප්‍රිශාන්ත සහ සල්ඩින් මෙලාති; (2008). *සංචාරක කර්මාන්තය (දියුණු වෙමින් පවතින රටවල් සහ සංචාරක නිෂ්පාදන),* සමන්ති පොත් ප්‍රකාශකයෝ; ජා-ඇල.

චන්ද්‍රතිලක, බී.එම්., (2014). *ශ්‍රී ලංකාවේ සංවර්ධනය හා යාථාර්ථය,* විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය; පෙරේරා මාවත, මුල්ලේරියාව.

ඥාණවිමල හිමි, කිරිඇල්ලේ; (1942). *සබරගමුවේ පැරණි ලියවිලි,* ජිනාලංකාර මුද්‍රණාලය; කොළඹ.

තුසිත මැන්දිස්, ඩී., ශ්‍යාමලී ගුණරත්න, එම්.ආර්., (2016). *උරුම කළමනාකරණ ප්‍රවේශය.* නෙත්වින් ප්‍රින්ටර්ස්; ගැටඹේ, පේරාදෙණිය, මහනුවර.

දිස්ත්‍රික් සංස්කෘතික අංශය; (සංස්). (2020). *කෑගලු විත්ති සමාජ හා සංස්කෘතික විමර්ශනය.* සංස්කෘතික අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය; කෑගල්ල.

පතිරණ, යූ.පී.එස්., (2010). *සංචාරක ව්‍යාපාර පසුබිම හා ප්‍රවණතා,* සූර්ය ප්‍රකාශන, කොළඹ.

පතිරණ, යූ.පී.එස්., (2012). *සංචාරක ව්‍යාපාරය - පරිසරය සමාජය හා ආර්ථිකය,* සරස්වතී ප්‍රකාශන; දිවුලපිටිය.

පතිරණ, යූ.පී.එස්., (2013). *සංචාරක ව්‍යාපාර විශේෂිත - නිෂ්පාදිත හා වෙළඳපොළවල්,* සරස්වතී ප්‍රකාශන; දිවුලපිටිය.

පතිරණ, යූ.පී.එස්., (2014). *සංචාරක ව්‍යාපාරය - සංචරණ සැලසුම්කරණය හා සංවර්ධනය,* සරස්වතී ප්‍රකාශන; දිවුලපිටිය.

පද්මිණී වික්‍රමලතා, ඩබ්.ඒ., තරිඳු බණ්ඩාර, සී.ඒ., (සංස්). (2022). *කෑගලු පුරාවත.* දිස්ත්‍රික් ලේකම් කාර්යාලය; කෑගල්ල.

පරණවිතාන, සෙනරත්; (1972). *"බුද්ධාගම පිහිටුවීම" ලංකා විශ්වවිද්‍යාලයෙ ලංකා ඉතිහාසය.* විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය; කැලණිය.

බිනරගම, දයානන්ද; (2006). *සබරගමු පැරණි රජදහන (මධ්‍ය වලව නිම්නය) මහබින්තැන්න,* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ; කොළඹ 10.

බෙල්, එච්.සී.පී., (2004). *කෑගල්ල දිස්ත්‍රික්කය පිළිබඳ වාර්තාව.* පරිවර්තක, කේ.බී.ඒ. එඩ්මන්, කොත්මලේ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

යටවර, එස්.එම්.ඩී.එම්., (2002). *බෙලිගල් කෝරළය සහ එහි ජාත්‍යන්තර සබඳතා.* ආරිය ප්‍රකාශකයෝ; බෞද්ධ විද්‍යාලය මාවත, වරකපොල.

යටවර, එස්.එම්.ඩී.එම්., (2009). *කෑගලු කෝරළ පවත.* ආරිය ප්‍රකාශකයෝ; බෞද්ධ විද්‍යාලය මාවත, වරකපොල.

වනසිංහ, ප්‍රියන්ත; (2011). *දැදිගම සූතිඝර දාගැබ.* පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

සුමංගල හිමි, පාහියංගල; (2020). *සංස්කෘතික සංචරණ ප්‍රවේශය සහ සංචාරක වෙළඳපොළ කාණ්ඩ,* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම; කොළඹ 10.

සුමංගල හිමි, පාහියංගල; (2021). *ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා.* සමුද්‍ර පොත් ප්‍රකාශකයෝ, කොන්සොලිඩේටඩ් පුද්ගලික සමාගම; කොළඹ 08.

**සඟරා**

කුලතුංග, එස්.ඩබ්.කේ.එස්., (2004) පරිසරය සුරකින සංචාරක කර්මාන්තයක, ආර්ථික විද්‍යා, සමාජ සංඛ්‍යාන, *දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගම් ශාස්ත්‍රීය සංග්‍රහය,* කැලණිය විශ්වවිද්‍යාලය.

**ශබ්දකෝෂ**

මලලසේකර, ජී. සී. (2004) *ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂය,* ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

## English Books

Deraniyagala, P.E.P., (1943). *Some Aspect of the Prehistory of Ceylon - Part 1, SPOLIA ZEYLANICA.* Bulletin of the National Museum of Ceylon.

Deraniyagala, S., (1968). *The Balangoda Culture (Late Stone Age), Ancient Ceylone, Vol 1*. Department of Archaeology, Colombo 07.

Deraniyagala, S., (2004). *The Prehistory of Sri Lanka, An Ecological Perspective*. Department of Archaeology, Colombo 07.

Paranavitana, S., (1970). *Inscription of Ceylon*. Colombo: Department of Archaeology.

Perera, N., (2014). *Prehistory of Sri Lanka, New Series, Volume 59, Part 2*. Royal Asiatic Society of Sri Lanka, Colombo.ine

## Elrctronic Tools

සමරවික්‍රම, ඉනෝකා; (2017). "අවසන් මහරහතුන් වැඩසිටි වට්ටාරම", ලබාගත් දිනයඃ 2023 මාර්තු 06, ලබාගත්තේඃ https://www.silumina.lk/2017/05/13/

Centre for climate Change Studies, Department of Meteorology,. (2019, june 20). Climate of Sri Lanka. Retrieved from Department of meteorology: http://www.meteo.gov.lk/index.php?option=com_content&view=article&id=94&Itemid=310&lang=en

District secretariat kegalle - government office in Kegalle (no date). Available at: Kegalle: http://www.kegalle.dist.gov.lk/index.php/en/about-us/overview.html (Accessed: January 30, 2023).

District secretariat kegalle' (2023). කෑගල්ල නැරඹුම් ස්ථාන, "දෙවන.," Available at: Kegalle: www.kegalle.dist.gov.lk/index.php/si/html (Accessed: March 09, 2023).

Home (no date) MindTools. Available at: https://www.mindtools.com/amtbj63/swot-analysis (Accessed: April 23, 2023).

Kraus, N., (2020) Mountain railways are very popular but it is not enough: .TR, Mountain Railways Are Very Popular but It Is Not Enough | .TR. Tourism Review Media. Available at: https://www.tourism-review.com/self-guided-tours-benefits-for-tourists-and-operators-news11352 (Accessed: April 5, 2023).

Liyanagedara, N. (2021). Available at: https://roar.media/Sinhala/main/history/beligala-temple-sri-lanka/ (Accessed: April 21, 2023).